ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

13 ශ්‍රේණිය – II වාර පරීක්ෂණය

කාලය පැය 02

- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (i), (ii), (iii),(iv), (v) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

1) සන්නිවේදන මූලිකාංග වලට අයත් නොවන්නේ
   i. මූලාශ්‍රය
   ii. ප්‍රතිපෝෂණය
   iii. බාධක
   iv. නාලිකාව
   v. දොරටුපාලකයාය

2) "ආකේතකරණය" යන්න සන්නිවේදන ක්‍රියාවලියේ අත්‍යාවශ්‍ය අංගයක් බව මුල්වරට පෙන්වා දුන්නේ
   i. හැරල්ඩ් ඩී ලැස්වෙල් ය
   ii. ෂැනන් හා පීටර් ය
   iii. ඩේවිඩ් කේ. බර්ලෝ ය
   iv. එඩ්වඩ් සැපිර් ය
   v. මාර්ෂල් මැක්ලූහක් ය

3) අමල්, කමල් සමඟ දුරකථනයෙන් කතා කරමින් සිටියි. මෙය අයත් වන්නේ
   i. ජනසන්නිවේදනයට ය
   ii. අන්තර් පුද්ගල සන්නිවේදනයට ය
   iii. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට ය
   iv. සමූය සන්නිවේදනයට ය
   v. අවාචික සන්නිවේදනයට ය

4) පහත සඳහන් සන්නිවේදන ආකෘති අතුරින් සන්නිවේදකයාගේ හා ග්‍රාහකයාගේ පොදු අත්දැකීම් පසුතලය සන්නිවේදන ක්‍රියාවලියේ සාර්ථකත්වයට බලපාන බව පෙන්නුම් කළ සන්නිවේදන ආකෘතිය වන්නේ
   i. ඔස්ගුඩ් හා ශ්‍රාම් ආකෘතිය මඟිනි
   ii. හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතිය මඟිනි
   iii. මැනින් වයිට් ආකෘතිය මඟිනි
   iv. ෂැනොන් පීටර් ආකෘතිය මඟිනි
   v. ඇරිස්ටෝටල් ආකෘතිය මඟිනි

5) පුවත්පත රටේ ප්‍රධාන පන්තිය වන කම්කරු පන්තිය කෙරෙහි තම මූලික අවධානය යොමු කළ යුතු බවත් පුවත්පත් නිදහස සෑම තරාතිරමකම අය කරා ගමන් කළ යුතු බවත් සඳහන් වූ සන්නිවේදන සංකල්පය වන්නේ

i. නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය
ii. සෝවියට් සමාජවාදී සන්නිවේදන සංකල්පය
iii. සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පය
iv. සංවර්ධන සන්නිවේදන සංකල්පය
v. ප්‍රජාතන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පය

6) අප ලබා ගන්නා තොරතුරු මතකයේ තැම්පත් වීම ආකාර කිහිපයකට සිදුවේ. පහත ක්‍රම අතරින් මතකයේ තැම්පත් වීමේ ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගන්නා ක්‍රමය වන්නේ

i. සිදුවූ දෙයින්
ii. ඇසූ දුටු දෙයින්
iii. කළ කී දෙයින්
iv. කියූ ලියූ දෙයින්
v. දුටු දෙයින්

7) විවිධ සන්නිවේදන අවස්ථාවල ප්‍රතිපෝෂණය සිදුවේ එවැනි අවස්ථාවන්ට සාපේක්ෂව ජනසන්නිවේදනයේ ප්‍රතිපෝෂණය සිදුවන්නේ

i. බහුල හා සීමිත ස්වරූපයෙන්
ii. සීමිත හා පමාවන ස්වරූපයෙන්
iii. සීමිත හා ක්ෂණික ස්වරූපයෙන්
iv. අතිශය සීමිත හා සාමාන්‍යයෙන් පමා වූ ස්වරූපයෙන්
v. අතිශය බහුල හා සාමාන්‍යයෙන් පමා වූ ස්වරූපයෙන

8) සන්නිවේදන නිර්වචන අතරින් සන්නිවේදනමය දෘෂ්ටි කෝණයකින් හා මනෝවිද්‍යාත්මක පදනමකින් සන්නිවේදනය විග්‍රහ කර ඇති නිර්වචනය වන්නේ

i. එඩ්වඩ් සැපිර් ගේ නිර්වචනය
ii. ඇරිස්ටෝටලියානු නිර්වචනය
iii. විල්බර් ශ්‍රාම් ගේ නිර්වචනය
iv. ෂැනන් හා පීටර් ගේ නිර්වචනය
v. හැරල්ඩ් ඩී ලැස්වෙල් ගේ නිර්වචනය

9) "ස්ව සංකල්පය යනු පුද්ගලයෙකු ඔහු පිළිබඳ සත්‍ය ලෙස සලකනු ලබන වටිනාකම් වලින් යුක්ත වූ විශ්වාසයෙන් සකස් වූ සංකීර්ණ ක්‍රියාකාරී පද්ධතියකි" මෙම අදහස ඉදිරිපත් කරන ලද්දේ

i. බර්න් විසිනි
ii. පර්කි විසිනි

iii. එවරට් එම් රොජර්ස් විසිනි
iv. මාර්ෂල් මැක්ලූහක් විසිනි
v. චාර්ල්ස් ඔස්ගුඩ් විසිනි

10) නිර්වාචික සන්නිවේදනය කලාත්මකව හා ප්‍රබලව යොදා ගත හැකි මාධ්‍ය වන්නේ

i. ගුවන්විදුලිය යි
ii. රූපවාහිනිය යි
iii. සිනමාව යි
iv. නව මාධ්‍යය යි
v. අන්තර් ජාලය යි

11) පොදු ජීවන රටාවක් සඳහා අවශ්‍ය හර පද්ධතිය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය මෙහෙවර අදාළ වන්නේ

i. සමාජානුයෝජනයට යි
ii. ස්ව සංකල්පයට යි
iii. ප්‍රචාරණයට යි
iv. සහානුභූතියට යි
v. සංජානනයට යි

12) එක් අන්තයක සිට එන පණිවිඩයක් අනෙක් අන්තයේදී නැවත හඬ බවට පරිවර්තනය වීම හඳුන්වන්නේ

i. විකේතකරණය
ii. අකේතිකරණය
iii. සම්ප්‍රේෂණය
iv. කේතකරණය
v. ප්‍රතිපෝෂණය

13) වර්තමාන ගෝලීකරණයේ දෘෂ්ටිවාදය වන්නේ

i. මාක්ස්වාදයයි
ii. ජාතිකවාදයයි
iii. ෆැසිස්ට්වාදයයි
iv. ලිබරල්වාදයයි
v. ප්‍රජාතන්ත්‍රයාදයයි

14) පහත සඳහන් ප්‍රකාශ නියෝජනය කරන භාෂා ප්‍රභේද නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න

A- අදහස්, වචන හඬ නැංවීමෙන් ඉදිරිපත් කිරීම

B- අණදීම්, ආයාචනා, ආත්ම ප්‍රකාශන ආදිය ඉදිරිපත් කළ හැකි වීම

C- ඉදිරිපත් කිරීමේ ආකෘතිය තිබීම

i. භාෂනය, කථනය, ලේඛනය
ii. කථනය, භාෂනය, ලේඛනය
iii. විවරණය, භාෂනය, කථනය
iv. භාෂනය, විවරණය, කථනය
v. භාෂනය, විවරණය, ලේඛනය

15) සංවර්ධනයේ දී ජාතාක අපේක්ෂා ඉහළ නැංවීමට ජනමාධ්‍ය භාවිත කළ හැකිය. මේ බව පෙන්වා දුන්නේ

i. විල්බර් ශ්‍රාම් ය
ii. ඩඩ්ලි සියර්ස් ය
iii. පෝල් පි ස්ට්‍රීවන් ය
iv. විමල් දිසානායක ය
v. එවරට් එම් රොජර්ස ය

16) කමලා සිය රැකියාවෙන් විශ්‍රාම ගැනිම නිසා සුපුරුදු ජීවන රටාවෙන් බැහැර වීමට ඇයට සිදුවිය අනපේක්ෂිත වෙනස්කම් හේතුවෙන් ඇය මානසික දුර්වල තත්වයට ද පත්විය මෙය

i. ආතතියේ ලක්ෂණයයි
ii. කාංසාවේ ලක්ෂණයයි
iii. ක්ලමථයේ ලක්ෂණයයි
iv. විශාදයේ ලක්ෂණයයි
v. ධ්‍රැවගතවීමේ ලක්ෂණයයි

17) සංවර්ධන සන්නිවේදනය යන සංකල්පය තහවුරු වූයේ

i. කාර්මික විප්ලවය ආරම්භ වූ පසුවය
ii. දෙවන ලෝක යුද්ධයට පසුවය
iii. ගෝලීයකරන ක්‍රියාවලියත් සමගය
iv. පළමු ලෝක යුද්ධයට පසුවය
v. නිරවි යුද්ධය අවසන් වීමෙන් පසුවය

18) ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ සංවාදයකදී ඉදිරිපත් වූ කරුණු කිහිපයක් පහත දැක්වේ

A- කාන්තාවන්, ළමයින් හා තරුණ පිරිස් පහසුවෙන් ආකර්ෂණය කර ගනියි

B- මහා පරිමාණ ලෙස නිෂ්පාදනයක් හා බෙදා හැරීමක් පවතියි

C- කලාත්මක අංශයෙන් ඉහළ තැනක් ගනියි

D- වාණිජත්වය සමඟ බැඳී පවතියි

E- ශ්‍රමිකයන් තුළ ඉක්මනින් ප්‍රචලිත වේ

ජනප්‍රිය සංස්කෘතිය සමඟ වඩාත් ගැළපෙන්නේ

i. A, B, C, D
ii. A, B, C, E
iii. A, B, D, E
iv. B, C, D, E
v. A, B, C, D, E

19) ව්‍යාපෘතියකට තොරතුරු ලබා ගැනීමේදී උපයෝගී කර ගත හැකි ක්‍රම අතරට අයත් නොවන්නේ

i. ප්‍රශ්නාවලි ක්‍රමයයි
ii. සම්මුඛ සාකච්ඡා ක්‍රමයයි
iii. නිරීක්ෂණ ක්‍රමයයි
iv. සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමයයි
v. ගවේෂණ ක්‍රමයයි

20) මාධ්‍ය සාක්ෂරතාව සහිත පුද්ගලයෙකුගෙන් ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරනුයේ

i. ලිඛිත හා මුද්‍රිත මාධ්‍ය වල අන්තර්ගත දෑ කියවා ගැනීමට ඇති හැකියාවයි
ii. ලිඛිත හා මුද්‍රිත මාධ්‍ය මඟින් මෙන්ම ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඔස්සේ ද තොරතුරු ලබා ගැනීමට ඇති හැකියාවයි
iii. ලිඛිත, ශ්‍රව්‍ය, දෘශ්‍ය, සියලු මාධ්‍ය ඔස්සේ තොරතුරු හුවමාරු සිදු කිරීමට ඇති හැකියාවයි
iv. ජනමාධ්‍ය ඔස්සේ ලැබෙන තොරතුරු අවබෝධ කර ගැනීමට ඇති හැකියාවයි
v. පෙළ, රූපය, ශබ්දය හෝ ඉන් කිහිපයක සුසංයෝගයෙන් තොරතුරු ලබා දීමට ඇති හැකියාවයි

21) සංස්කෘතික හුවමාරුවකදී දැකිය නොහැකි වන්නේ

i. සමාජ පරිවර්තනයන් සිදුවීමයි
ii. සැලසුම් සහගත වීමයි
iii. සැලසුම් සහගත නොවීමයි
iv. සමාජීය සම්ප්‍රදායන් දැඩිව පැවතීමයි
v. සමාජීය සහජීවනයට හේතුවීමයි

22) පුද්ගලයාගේ අවශ්‍යතා සපුරාගත නොහැකි වීම නිසා ගැටුම් ඇතිවේ. මාස්ලෝ සඳහන් නොකල නමුත් ගැටුම් වලට තුඩුදෙන පුද්ගල අවශ්‍යතා වන්නේ

i. කාලීන අවශ්‍යතා
ii. ශාරීරික අවශ්‍යතා
iii. ආරක්ෂණ අවශ්‍යතා
iv. සමාජ අවශ්‍යතා
v. ආත්ම පූර්ණ අවශ්‍යතා

23) ආයතනයක අභ්‍යන්තර මහජන සම්බන්ධතා සම්බන්ධතා සාර්ථකව පවත්වාගෙන යෑමේදී වඩාත් වැදගත් වන්නේ

i. නිවේදන, පෝස්ටර්, දැන්වීම් හා අත්පත්‍රිකා
ii. සුබ සාදක සමිති, ක්‍රීඩා සමිති, වෘත්තීය සමිති, දිරි දීමනා
iii. සාකච්ඡා, සම්මන්ත්‍රණ, සුහද හමු, වාර්ෂික චාරිකා
iv. නිල ඇඳුම්, වැටුප් වාර්ධක, සෞඛ්‍ය දීමනා, ගමන් ගාස්තු ගෙවීම්
v. මාණ්ඩලික රැස්වීම්, තාක්ෂණික රැස්වීම්, කමිටු රැස්වීම්, වැඩමුළු

24) භාෂා උපර්ජනය යනුවෙන් හඳුන්වන්නේ

i. භාෂාවේ පොදු හා අනන්‍ය ලක්ෂණ හඳුනාගැනීමයි
ii. වචන වලට නව අර්ථ ජනනය කිරීමයි
iii. වචන වල අර්ථය අනුව භාවිතයයි
iv. භාෂාව ග්‍රහනය කර ගැනීම හා පරිහරණය ඉගෙනීමයි
v. භාෂාවේ රීති මනාව හඳුනගෙන භාවිතයයි

25) ජනමාධ්‍ය තොරතුරු වල දැකිය හැකි වඩාත් කැපී පෙනෙන ලක්ෂණය වන්නේ

i. සංකීර්ණතාවයයි
ii. දෛනිකත්වයයි
iii. විවිධත්වයයි
iv. ඓතිහාසිකත්වයය
v. පරිවර්තනයයි

26) අතීතයේ දී මහජන සම්බන්ධතා නිලධාරියාගේ කාර්යභාරය බොහෝ විට ඉටු කරන ලද්දේ

i. කාන්තාව විසින්
ii. ආගමික පූජකවරු විසින්
iii. තරුණ පිරිස් විසින්
iv. රජ පවුලේ සාමාජිකයන් විසින්
v. වෘත්තිකයන් විසින්

27) නව මාධ්‍යයන් හි භාෂාව හැසිරවීම සම්බන්ඳයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න

i. කෙටි පද, යෙදුම් නව මාධ්‍යයන් හි භාවිත වේ
ii. නව මාධ්‍යයන් හි ඇති සීමිත ඉඩකඩ හා පිරිවැය නිසා ලේඛන කෙටි විය යුතුය
iii. නව මාධ්‍යය බොහෝමයක් ජාත්‍යන්තර භාෂාවලින් ක්‍රියාත්මක වේ
iv. වර්තමානයේ සන්නිවේදන කාර්යය සඳහා නව මාධ්‍ය බහුලව භාවිත වේ
v. නව මාධ්‍ය නිසා දේශිය භාෂාවන්ගේ වර්ධනයක් දැකිය හැකිය

28) වේදිකා නාට්‍යයකදී වඩාත් දැකගත හැකි වන්නේ

i. විධිමත්, වාචික, ශ්‍රව්‍ය, දෘශ්‍ය සන්නිවේදනයයි
ii. වාචික, අවාචික, ශ්‍රව්‍ය, දෘශ්‍ය සන්නිවේදනයයි

iii. ශ්‍රව්‍ය, වාචික, අවධිමත්, දෘශ්‍ය සන්නිවේදනයයි
iv. වාචික, අවාචික, අවධිමත්, ලේඛන සන්නිවේදනයයි
v. දෘශ්‍ය, ලිඛිත, විධිමත්, අවිධිමත් සන්නිවේදනයයි

29) " පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පුවත්පත් මාධ්‍ය යොදා ගැනීම" යන මැයෙන් ක්‍රියාත්මක කළ සන්නිවේදන ව්‍යාපෘතියක වාර්තාව සැකසීම ඔබට බාර වී තිබේ. එම වාර්තාවට ඇතුලත් නොකළ යුත්තේ

i. පර්යේෂණ ක්‍රමවේදය කවරේද යන්න
ii. භාවිතා කළ නියැදිකරණ විධි ක්‍රමයයි
iii. නිගමන හා යෝජනාය
iv. සංවර්ධන ව්‍යාපෘති වර්ගීකරණයයි
v. යොදා ගත් මානව හා භෞතික සම්පත්ය

30) ජනමාධ්‍ය වලින් ඉදිරිපත්වන සංදේශ නිසිපරිදි අර්ථකථනය කර ගැනීමට, අවබෝධ කර ගැනීමට අවශ්‍ය වන්නේ පුද්ගලයා තුළ පවතින මාධ්‍ය

i. සංජානන ශක්තියෙනි
ii. විචාරාත්මක ඥානයෙනි
iii. සාක්ෂරතා ඥානයෙනි
iv. ඇගයීම් ශක්තියෙනි
v. විශ්ලේෂණාත්මක ඥානයෙනි

31) පුරවැසි ජනමාධ්‍ය

i. සමාජයේ සියලුම සාමාජිකයන් වෙනුවෙන් රජය මඟින් පාලනය කෙරෙයි
ii. පුරවැසියන්ගේ සහභාගිත්වය ලබා ගනී
iii. සමාජ සංවිධාන වල හා වෙනත් පුරවැසි කණ්ඩායම්වල එකතුවකි
iv. සියලු පුරවැසි අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියාත්මක වේ
v. අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ

32) ශ්‍රවණ ක්‍රියාවලිය යනු ප්‍රගුණ කළ හැකි ශක්‍යතාවයකි. මෙහි අනුපිළිවෙළ වන්නේ

i. ඇසීම, තේරුම් ගැනීම, ඇගයීම හා ප්‍රතික්‍රියා දැක්වීම
ii. තේරුම් ගැනීම, ඇසීම, ඇගයීම හා ප්‍රතික්‍රියා දැක්වීම
iii. ඇසීම, ඇගයීම, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියා දැක්වීම
iv. තේරුම් ගැනීම, ඇසීම, ප්‍රතික්‍රියා දැක්වීම, ඇගයීම
v. ඇසීම, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියා දැක්වීම, ඇගයීම

33) සාමූහිකවකව කටයුතු කිරීමේ දී ඔබට සෘජුවම පවරා නැති සමහර කාර්ය සිදු කිරීමට වක්‍රව බැඳීමක් ඇතිවන අවස්ථා එමට හමුවේ. එවැනි දෑ

i. වගකීම් වේ
ii. වගවීම් වේ
iii. යුතුකම් වේ
iv. වරප්‍රසාද වේ
v. ආචාරධර්ම වේ

34) ඔබ නියෝජනය කරන තරුණ සමිතියට දේශීය සංවර්ධන ව්‍යාපෘතියකට අදාළ පර්යේෂණයක් සඳහා ඇරයුම් ලැබුණේයැයි උපකල්පනය කරන්න. එහිදී ඔබ විසින් මූලිකවම අවධානය යොමු කළ යුතු වන්නේ

i. පූර්ව සමීක්ෂණ සඳහා තෝරාගනු ලබන නියැදිය පිළිබඳවය
ii. යොදාගත යුතු පර්යේෂණ නිලධාරීන් හා සංඛ්‍යාව පිළිබඳවය
iii. පර්යේෂණ යෝජනාවලිය පිළිබඳවය
iv. පර්යේෂණ මඟින් ලැබෙන මූල්‍යමය වාසිය පිළිබඳවය
v. පර්යේෂණය සඳහා ගතකරන කාලය පිළිබඳවය

35) විකල්ප ජනමාධ්‍ය පිළිබඳ මිතුරන් කිහිපදෙනෙකු අතර ඇතිවූ සංවාදයක් පහත දැක්වේ

නිමලා - ලාභයක් ලබන්න පුළුවන් වුනත් ඒක ප්‍රධාන අරමුණක් නොවේ
කමලා - ඒ වුණාට ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය වලට අභියෝගයක් එල්ල කරනවා
අමරා - ඒත් ඒ අය ඉලක්ක කරගන්නේ කුඩා ග්‍රාහක කණ්ඩායමක් නේ
විමලා - කොහොම වුනත් ඒවායේ තියෙන්නේ අපක්ෂපාතී ජනමාධ්‍ය භාවිතයක්

ඉහත ප්‍රකාශ අතුරින් ශ්‍රී ලංකාවේ විකල්ප ජනමාධ්‍ය වලට අදාළ ප්‍රකාශය වන්නේ

i. නිමලා හා කමලා
ii. නිමලා හා අමරා
iii. නිමලා, අමරා හා කමලා
iv. කමලා,අමරා හා විමලා
v. නිමලා, කමලා, අමරා හා විමලා යන සියල්ලම

36) "ජාතියක සංවර්ධනය සඳහා සහභාගී වීම එයින් වැලකී සිටිනවාට වඩා යහපත්ය" එම අදහස ප්‍රකාශ කරන ලද්දේ

i. ඩැනියල් ලර්නර් විසිනි
ii. එවරට් එම් රොජර්ස් විසිනි
iii. විල්බර් ශ්‍රාම් විසිනි
iv. මාර්ශල් මැක්ලූහක් විසිනි
v. ලූෂන් පායි විසිනි

37) ගුවන්විදුලි මාධ්‍ය සතුවිය යුතු සුවිශේෂී ලක්ෂණය ලෙස සැලකිය හැක්කේ

i. මිනිස් සිත කම්පනය කරන මාධ්‍යයක් වීම
ii. සරල භාෂා රටාවකින් යුක්ත මාධ්‍යයක් වීම
iii. ගෘහස්ථ පරිභරණය කරන මාධ්‍යයක් වීම
iv. හුදකලා බව නැතිකරන මාධ්‍යයක් වීම
v. වෙළඳ ප්‍රචාරණ මාධ්‍යයක් වීම

38) "මහජන සම්බන්ධතාව යනු කිසියම් සංවිධානයක් සහ එයට අදාළ ජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කර පවත්වා ගෙනයාම සඳහා සිතාමතා සැලසුම් සහගතව ඉවසීමෙන් යුතුව දරනු ලබන ප්‍රයත්නයකි" මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ

i. බ්‍රිතාන්‍ය මහජන සම්බන්ධතා ආයතනයෙනි
ii. එඩ්වඩ් එල් බර්නිස් විද්‍යාඥයා විසිනි
iii. ඇමරිකානු මහජන සම්බන්ධතා ආයතනයෙනි
iv. ඉන්දියානු මහජන සම්බන්ධතා ආයතනයෙනි
v. අයිවි ලී විද්‍යාඥයා විසිනි

39) සම්මත භාෂාවන්හි පොදු ලක්ෂණය වන්නේ භාෂාවේ

i. අගනාකම් උල්ලංඝනය කිරීමයි
ii. වර්ධනයක් සිදුනොවීමයි
iii. පිළිගත් සම්ප්‍රදායන්ට අනුව ක්‍රියා කිරීමයි
iv. අනන්‍ය ලක්ෂණ නොතිබීමයි
v. ව්‍යවහාර ලක්ෂණ සලකා බැලීමයි

40) ගැටුම් අවස්ථා තුනක් සඳහා වන පහත ප්‍රකාශ සමඟ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න

A - ඔබ කරපු දේ හරි කියලා හිතන්න එපා. මම එයට විරුද්ධයි

B - මොන ටෙලිනාට්‍ය ද අද අපි බලන්නේ කියලා හිතාගන්න බෑ. අද අපි ටෙලිනාට්‍ය නොබලා ඉමු

C - මම හිතන්නේ අපි දෙගොල්ලන්ටම එකඟ වෙන්න පුළුවන් තැනකට අපි දැන් ඇවිල්ලා ඉන්නේ

i. A ජය - ජය B ජය - පරාජය C පරාජය - පරාජය
ii. A ජය - ජය B පරාජය - පරාජය C ජය - පරාජය
iii. A පරාජය - පරාජය B ජය - පරාජය C ජය - ජය
iv. A ජය - පරාජය B පරාජය - පරාජය C ජය - ජය
v. A ජය - පරාජය B ජය - ජය C පරාජය - පරාජය

41) ප්‍රධාන පෙළේ බිස්කට් සමාගමක සේවකයන්ගේ වාර්ෂික විනෝද චාරිකාවට යොදාගත් බස් රථ සියල්ලේම ආයතනයේ සන්නාමය (Brand Name) සහිත වර්ණ ස්ටිකර් වලින් සරසා තිබුණි. මෙවැන්නකින් මූලිකවම අපේක්ෂා කරන්නේන

i. ආයතනයේ කීර්ති නාමය ප්‍රචලිත කිරීමයි

ii. අභ්‍යන්තරික මහජන සම්බන්ධතා උපක්‍රමයක් භාවිතයට ගැනීමයි
iii. සේවක සුබ සාධනය ගැන උනන්දුව පෙන්නුම් කිරීමයි
iv. නිර්මාණාත්මක ප්‍රචාරණයක් ලබා ගැනීමයි
v. සේවකයන්ට තමා පැමිණි බස් රථ හඳුනා ගැනීමටයි

42) සමාජයෙහි සහජීවනය සහ සංහිඳියාව වර්ධනය කිරීමට බලපාන සංස්කෘතික ප්‍රවනතාව නොවන්නේ
i. සංස්කෘතික ඒකාකෘතිකරණයයි
ii. සංස්කෘතික සංසරණයයි
iii. සංස්කෘතික හුවමාරුවයි
iv. සංස්කෘතික විසරණයයි
v. සංස්කෘතික රෝපණයයි

43) වියළි හා අර්ධ ශුෂ්ක අතිශය පිටිසර ග්‍රාමීය ප්‍රදේශ වලට සූර්ය කෝෂ මඟින් විදුලිය ජනනය කළ හැකි ක්‍රම හඳුන්වා දීමේ ව්‍යාපෘතියකදී යොදාගත හැකි වඩාත් සුදුසු සන්නිවේදන ක්‍රමෝපාය වන්නේ
i. නව මාධ්‍ය යොදා ගැනීමයි
ii. ගුවන්විදුලි වැඩසටහන් විසුරුවා හැරීමයි
iii. පුවත්පත් අතිරේක පළ කිරීමයි
iv. පත්‍රිකා, පෝස්ටර් මඟින් දැනුවත් කිරීමයි
v. ගෙන් ගෙට ගොස් පැහැදිලි කර දීමයි

44) නූතන ජනමාධ්‍ය හා සාපේක්ෂව සාම්ප්‍රදායික මාධ්‍ය තුළ දක්නට නොලැබෙන ලක්ෂණය වන්නේ
i. පුද්ගල භාවයන්ට වඩාත් සමීප වීමය
ii. ආකෘතියේ හා අන්තර්ගතයේ සමීප බවය
iii. ප්‍රාදේශිය භාෂා ව්‍යවහාර යොදා ගැනීමය
iv. වැඩි පෙළඹවීමකින් යුක්ත වීමය
v. සංවිධානගත වූ ව්‍යූහයකින් යුක්ත වීමය

45) "ස්ටාර්" මාධ්‍ය ආයතනය විසින් සිය ආයතනයේ ප්‍රගතිය දැනුම් දීම සඳහා මාධ්‍ය සාකච්ඡාවක් කැඳවා තිබුණි. එය ඵලදායී සන්නිවේදන ක්‍රියාවලියක් බවට පත්වීමට නම්
i. පැමිණෙන මාධ්‍ය ආයතනවල අයට හොඳින් සංග්‍රහ කළ යුතුය
ii. එකම අරමුණක් ඔස්සේ සාකච්ඡාව පැවැත්විය යුතුය
iii. මනා ලෙස කාල කළමණාකරණය කළ යුතුය
iv. තොරතුරු ගොනුවක් ලබා දිය යුතුය
v. ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දිය යුතුය

46) තොරතුරු විසරණය සඳහා යොදාගත හැකි විධි ක්‍රම කිහිපයක් පහත දැක්වේ

A - ස්ථාවර දුරකථන සේවාව B - ජංගම දුරකථන සේවාව

C- සාමාන්‍ය තැපැල් සේවාව D- විද්‍යුත් තැපැල් සේවාව

E- කෙටි පණිවිඩ සේවාව

මේවා අතුරින් පුද්ගලාන්තර සන්නිවේදන නාලිකා ලෙස යොදාගත හැක්කේ

i. A හා B පමණි
ii. A, B හා D පමණි
iii. A,B,D,E පමණි
iv. A,B,C,D E පමණි
v. A,B,C,D පමණි

47) ග්‍රාහක ක්ෂේත්‍රය වෙත ප්‍රවේශ වීමේ බලාපොරොත්තුවෙන් ජනමාධ්‍යයේ කාලය හෝ අවකාශය මිලදී ගන්නේ

i. මාධ්‍ය හිමිකරුරුවන්ය
ii. මහජන සම්බන්ධතා ක්‍රියාකාරීන්ය
iii. ප්‍රතිරූප ගොඩනගන්නන්ය
iv. අනුග්‍රාහක භවතුන්ය
v. වෙළඳ දැන්වීම්කරුවන්ය

48) තොරතුරු බෙදාහැරීමේ බටහිර ආධිපත්‍ය යනුවෙන් අදහස් කරන්නේ

i. බටහිර රටවල් පවත්වාගෙන යනු ලබන වෙළඳ ආධිපත්‍යයයි
ii. සංවර්ධනය වෙමින් පවතින රටවලට සම්බාධක පැනවීමයි
iii. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ තොරතුරු ව්‍යාප්ත කිරීමයි
iv. තොරතුරු මාධ්‍යයක් වන අන්තර් ජාලයට සීමා පැනවීමයි
v. ඔවුන්ගේ අභිමතය පරිදි තොරතුරු ප්‍රවාහය හැසිරවීමයි

49) පුවත්පත් භාෂා භාවිතයේදී නොගැළපෙන ලක්ෂණයක් වන්නේ

i. සරල භාෂා රටාවකින් රචනා වී තිබීමය
ii. ගැඹුරු භාෂා රටාවකින් රචනා වී තිබීමය
iii. ඉලක්ක කණ්ඩායම් වලට යෝග්‍ය පරිදි රචනා වී තිබීමය
iv. සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා වෙනස් වීමය
v. ලේඛනයේ ස්වරූපය අනුව රටාව වෙනස් වීමය

50) මාධ්‍ය සංස්කෘතිය හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ

A -- ග්‍රාහක ක්ෂේත්‍රයේ අවශතා පිළිබඳ සැලකිලිමත් වේ

B -- අදාළ සමාජ ගතිකයන්ට අනුව හැඩගැස්වේ

C -- සන්නිවේදනයේ සියලු කොටස් ඒ තුළ අන්තර්ගත වේ

D -- එය මානව සංස්කෘතියේම කොටසක් වේ

මාධ්‍ය සංස්කෘතිය යන්නට අදාළව ඉහත කරුණු වලින් සත්‍යවන්නේ

i. A, B පමණි
ii. A, B, C පමණි
iii. A,B,D පමණි
iv. B,C,D පමණි
v. A,B,C,D යන සියල්ලම